# කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නව වැඩපිළිවෙල යටතේ ඌරන් බෝකරන්නන් ලියා පදිංචි කිරීම

වැලිසර රජයේ සත්ව ගොවිපලේ සහකාර කළමනාකාර වී. ඩී. ජී. ඇස්. සිරිසේන විසිනි.

ඉතා සීඝ්‍රයෙන් වැඩි වී ගෙන යන ලෝකයේ ජනගහනයට අවශ්‍ය ආහාර සම්පාදනය කිරීම, විශේෂයෙන්ම ජීවියාගේ පැවැත්මට අත්‍යාවශ්‍ය මාංශ ජනක ආහාර දුලබ මෙවැනි යුගයක මනා උත්පාදන ශක්තියක් ඇති ඌරා ඒ සඳහා ප්‍රයෝජනයට ගැනීම මූලික පරමාර්ථය කරගත් ඌරන් බෝ කරන්නන් ලියාපදිංචි කිරීම වැලිසර රජයේ සත්ව ගොවිපලින් ආරම්භ කර ඇත. වැලිසර සත්ව ගොවිපල අවුරුදු දහයක පමණ කාලයක සිට වසරකට ඌරු පැටවුන් 2,000 ක් පමණ බැගින් මේ දක්වා පැටවුන් 20,000 කට අධික ප්‍රමාණයක් නොයෙක් ආකාරයෙන් බෝකර ගැන්ම සඳහා මහජනයා වෙත බෙදූදී ඇත. පළාතේ රජයේ පශු වෛද්‍ය නිලධාරීන් දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන් හා කෘෂිකර්ම උපදේශක යන් මේ කාර්යයෙහි ලා උපකාරී වූවෝ වෙති.

මේ අන්දමට මහජනයා වෙත ලබාදුන් සතුන්ගෙන් කොපමණ සංඛ්‍යාවක් බෝකිරීම සඳහා සත්‍ය වශයෙන්ම යොදා ගන්නේද යන්න සොයා බැලීම පිණිස සහකාර අධ්‍යක්ෂ (සත්ව නිෂ්පාදන) ආචාර්ය ඇම්. ඊ. පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් ද සත්ව පාලන නිලධාරි (සූකර අභිජනන) ඩී. බී. බණ්ඩාර නායක මහතාගේ සහභාගිත්වයෙන්ද කළ සමීක්ෂණයේදී පෙනී ගියේ බෝකිරීම පිණිස අප දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා සතුන් කෙලින්ම මස් පිණිස විකුණා ඇති බවය. මෙම සමීක්ෂණයේදී අනාවරණයවූ අනෙක් කරුණ නම් වසරකට ලංකාවට අවශ්‍ය වන සතුන් ප්‍රමාණය වන ඌරන් 6,000 ලංකාවේ නොමැති බවයි. එයට හේතුව බෝ කිරීම පිණිස ලබා ගන්නා සතුන් යන්තමින් තරවූ පසු මස් පිණිස විකුණා ගැනීමයි.

ඌරන් බෝකරන්නන් ලියාපදිංචි කිරීමේ වැඩ පිළිවෙල යටතේ මෙකී තත්ත්වය මග හරවා ලීමටත් ලංකාවට මස් පිණිස වසරකට අවශ්‍ය ඌරන් සංඛ්‍යාව නිෂ්පාදනය කිරීමටත් අවශ්‍ය විධි විධාන සලසා ඇත.

රටක ජනගහනයට අවශ්‍ය මාංශ ජනක ආහාර ලබා ගත හැකි ක්‍රම කිහිපයක් වෙයි. ලෝකයෙන් 2/3 ක පමණ බිම වසාගත් මහා සාගරයෙන් පවා අප මෙතෙක් සත්ව ආහාර වශයෙන් ලබාගෙන ඇත්තේ ඉතාමත් අල්ප වූ ප්‍රමාණයකි. ගොඩබිමින් ලබා ගත හැකි ගව, එළු, බැටළු, කුකුල් වැනි සත්ව ආහාර වැඩී වේගන යන ජනගහනයට අත්‍යාවශ්‍ය වන තරමට නිපදවිය නොහැකි අතර මේ සත්ව ආහාර සඳහා වැඩි වියදමත් ශ්‍රමයත් මෙන්ම මූලධනයන්ද වැය කළ යුතු වෙයි. එවැනි ආර්ථික බාධක මැඩලිය හැකිනම් වර්ගයා සීඝ්‍රයෙන් බෝකර දිය හැකි මනා උත්පාදන ශක්තියක් ඇති ඌරා ප්‍රයෝජනයට ගෙන ලංකාවේ වැඩෙන ජනගහනයට අවශ්‍ය ඌරු මස් ප්‍රමාණය අඩු වියදමකිනුත්, ශ්‍රමයකින් හා මූලධනයකින්ද කළ හැකියි. මෙය වඩාත් කැපී පෙනෙන්නේ මස් පිණිස ඇති කරණ ගව, එළු, කුකුල් වැනි අනෙකුත් සත්ව පාලනය හා ඌරු පාලනය අතර ඇති විෂමතාවය පිරික්සීමෙනි. ඊරියක් වරකට පැටව් බොහෝ ගණනක් ප්‍රසූත කරනවාත් හැර පැටව් ගැසීම


ආරම්භ කරන්නේ මාස 12 ක් පමණවූ ලපටි වියේදීමය. මාස 8 දී ගැබ් ගැන්විය හැකි ඊරිය තවත් මාස 4 කින් පැටව් ප්‍රසූත කරයි. අවුරුද්දකට ඌරු පරම්පරාවන් දෙකක් බිහි කරන ඊරියක මුල් වාරයේදී පැටව් 8-10 ක් අතර ප්‍රමාණයක් ප්‍රසූත කරන අතර දෙවෙනි වාරයේ සිට වරකට පැටව් 10-14 ක් දක්වා ගණනක් ප්‍රසූත කරයි. එළදෙනකුගේ තත්වය මීට ඉඳුරාම වෙනස්ය. මාස 30-36 ක කාලයක් එළදෙනෙක ගැබ් ගැන්වීමට බලා සිටිය යුතු අතර තවත් 10 මාසයකට ආසන්න කාලයක් පැටව් බිහිවෙනතුරු බලා සිටිය යුතුයි.

හතර අවුරුද්දකදී ඊරියක් තම වර්ගයා දහස් ගණනින් බෝකරද්දී එළදෙන අවුරුදු 4 කටම බිහිකර ඇත්තේ එකම පැටවෙකු පමණකි. නිෂ්පාදන ශක්තිය අතින් පමණක් නොව පාලන කාර්යයෙන්ද මේ වෙනස කැපී පෙනෙයි. ඌරකු පෝෂණය සඳහා ඉතාමත් අඩු වියදමක් හා බිම් ප්‍රමානයක් වැයවන අතර එළදෙනකුගේ පෝෂණයට වැඩි බිම් ප්‍රමාණයකුත් වැඩි වියදමකුත් දරන්නට සිදු වෙයි. ඉතාමත් අඩු වියදමකින් වැඩි ආදායම් ප්‍රමාණයක් උපදවාලීමට හැකිවීම ඌරු පාලන යෙහි ඇති වැදගත්ම කාර්යයයි. එසේ වීමට හේතුවී ඇත්තේ අඩු මුදලකින් ඌරන් පෝෂණය කිරීමට ඇති හැකියාවයි. ගෙදර දොර අපතේ යන (තැම්බූ) ආහාර ද්‍රව්‍ය හා ඉඳුල් ඌරාගේ ප්‍රධාන ආහාරය වන අතර මේවා ඉතාමත් අඩු මිළට සපයා ගතහැකි වන්නේය. ඌරන් ඇති කිරීමේදී අප විසින් මහන්සි ගතයුත්තේ ඉතාමත් අඩු වියදම කින් මස් රාත්තලක් නිපදවීමයි. ඉක්මනින් වැඩීමේ ශක්තිය ඇත්තේ ඌරාගේ ලපටි අවදියේ හෙයින් ඌරාට වැඩි පුර ආහාර දිය යුත්තේ ලපටි වියේදීමය.

ලංකාවේ ඌරු පාලනයේ නිරතවන්නන් වැඩි වශයෙන් ඇත්තේ මුහුදු බඩ තීරයේය. මෙය කලාප 3 කට බෙදා වෙන් කළ හැකියි:

1. හලාවත සිට මීගමුව දක්වා
2. මීගමුව සිට මොරටුව දක්වා
3. මොරටුව සිට ඉඳුරුව දක්වා

ප්‍රධාන වශයෙන් බෙදළිය හැකි මෙම කලාප තුනේ ඌරන් බෝකිරීම සම්බන්ධ වැඩි ඇල්මක් ඇති සාමාජිකයින් 100 ක් තෝරාගෙන ඌරන් බෝකරන්නන් ලෙස ලියාපදිංචි කිරීමට වැලිසර සත්ව ගොවිපල මූලික කටයුතු ඇරඹීය. මෙම තෝරාගත් සාමාජිකයන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන අංශයත් සමග කොන්දේසි කිහිපයකට බැඳිය යුතුවෙයි. එහි ප්‍රධානම දෙය වන්නේ මොනම හේතුවක් නිසාවත් දෙපාර්තමේන්තුවෙන් වරණයකොට ලබාදුන් සතුන් දෙපාර්තමේන්තුවට නොදන්වා විකිණීම සම්පූර්ණයෙන්ම තහනම් කිරීමයි. මේ හැර සාමාජිකයන් සතු යුතුකම් කිහිප යක්ද වෙයි. තමන්ගේ සතුන් ගැන සෑම මසකම ප්‍රගති වාර්තාවක් සැපයීම කළ යුතුයි. මෙම වාර්තා නිසි පරිදි සකස්කර කලට වේලා වට එවීමෙන් ඒ ඒ මාසයන්හි තම සාමාජික යන්ට මුහුණ දීමට සිදුවූ ප්‍රශ්න සම්බන්ධව අවබෝධයක් දෙපාර්තමේන්තුවට ලබා ගත හැකිවාත් පමණක් නොව අවශ්‍ය උපදෙස් කඩිනමින් සැපයීමටද හැකිවේයි.




තම සාමාජිකයින්ට සතුන් ලබා දීමේදී දෙපාර්තමේන්තුව ඒ සඳහා ඉතාමත් යෝග්‍ය තත්ත්වයේ පසුවන සතුන් වරණය කොට ලබාදෙයි. සතුන්—

1. නුමුහුන් ආරයකින් පැවැත්ම
2. උපතින් බර රාත්තල් 3 ක් හෝ ඊට වැඩිවීම

3. මවගෙන් වෙන් කිරීමේදී පැටවෙකුගේ බර රාත්තල් 30 ක් හෝ ඊට වැඩි වීම

4. පැටවෙකුගේ තනපුඩු 12 කට වැඩිවීම

5. නියම ශාරීරික සෞඛ්‍යයෙන් පසුවීම

6. වර්ගයට අයිති ගුණාංග තිබීම

7. මවුගෙන් වෙන් කිරීමේදී රංචුවේ පැටව් 10 කට වැඩියෙන් සිටීම

සතුන් වරණය කිරීමේදී අනුගමනය කරන මෙම පිළිවෙත නිසා ඉතාමත් හොඳ ශරීර සෞඛ්‍යයෙන් හා උත්පාදන ශක්ති යෙන් යුතු පැටවුන් බෝකරන්නන් වෙත ලබා දීමට දෙපාර්තමේන්තුවට හැකි කමක් ලැබෙන අතර රටට අවශ්‍ය මස් ප්‍රමාණය නිපදවීමට හැකි තරම් ඌරන් සංඛ්‍යාවක් බෝකරන්නන්ට නිෂ්පාදනය කිරීමට හැකි වෙයි.

මේ හැරත් සහකාර අධ්‍යක්ෂ (සත්ව නිෂ් පාදන) ආචාර්ය ඇම්. ඊ. පෙරේරා මහතාගේ උපදෙස් පිට සත්ව පාලන නිලධාරී (සූකර අභිජනන) ඩී. බී. බණ්ඩාරනායක මහතාගේ මාර්ගෝපදේශකත්වය ඇතිව වැලිසර රජ යේ සත්ව ගොවිපලට අනුබද්ධව කෘෂිකර්ම උපදේශක (ඌරු ව්‍යාප්ති) වරයෙකු පත් කොට ඇත. මොහු වරින් වර තම සාමාජික යින් මුණ ගැසී ඔවුන්ගේ ප්‍රශ්න ගැන සුදුසු උපදෙස් දෙනු ඇත. දෙපාර්තමේන්තුවත් සාමාජිකයනුත් අතර ඇති අන්‍යොන්‍ය සම් බන්ධතාවය නිසා පැටවුන් විකිණීම, තර කරන සතුන්ට වෙළඳ පොලක් පහසුවෙන් ලබාදීම වැනි පහසුකම් සාමාජිකයින්ට ලැබෙන අතර රටට අවශ්‍ය මාංශ ජනක ආහාර ප්‍රමාණයක නිමැයුමද, අඩුවියදමින් වැඩි ආදායමක් උපයා රැකියා විරහිත කොට් ඨාශයක සෙත සැලැස්මක්ද නිරායාසයෙන් ම සිදුවන්නේය.

### මිද්දෙනිය රජයේ ගොවිපලේ
### කාර්යභාර නිලධාරී, පී. වත්තිගම විසිනි

පෙර රජවරුන් කල වී අවු දමන ලද
කුරහන් බිහිවලින් පුරවා තබන ලද
ලක් බිම වීරවරයින් බිහි කරන ලද
මම වැද වැටෙමි රුහුණට මගෙ දෙඅත් බැඳ

පෙර වීරයින් බැඳි වැව් දහඩිය පෙරමින්
වැඩිහරියක්ම අද හිස්වී ඇත ජලයෙන්
මේ ගැන හිතෙන විට මගෙ හදවත සෝකෙන්
අද පුරවන්න වී අත මට නෙත කඳුලෙන්

කන්නට අඳින්නට නැති අය ලන සුසුම් න්
හෝ හඬ දිදී නැගයයි අද රුහුණ මැදින්
එදවස ඉසුරුමත් කලහැටි නොසිතී මෙන්
අවමානයක් කර ඇති දැන් රුහුණු පුතුන්

සරු සාරවත් කලහැකි බිම් හැම තැනම
වල් බිහිවී තිබේ බැලු බැලු දස අතම
තරුණනි පිබිදෙන්න ඉපදුනු රුහුණු බිම
යමු ඉදිරියට පෙරදින මෙන් පා විකුම